"අඹු කමට ගැනීමක්" ද? බාලවයස් ලිංගික අපයෝජනයක් ද?

සමාජයේ පවත්නා ඇතැම් වරදක් මාධ්‍ය මගින් සැහැල්ලු කොට වාර්තා කරනු ඇතැම් විට දක්නට ලැබේ. ඒ ඔස්සේ එවැනි වරදක ඇති බරපතළ භාවය සමාජයට සන්නිවේදනය නොවීමට හැක. එය ඇතැම් විට එවැනි වරදක් සාමාන්‍යකරණය වීමට ද හේතු විය හැක.

"මව සහ දියණිය අඹුකමට ගත් ශ්‍රමණ වෙස් ගෙන සැඟවී සිටි අයෙක් දැලේ" යන සිරස්තලය යටතේ දැක්වෙන දිවයින පුවත් වාර්තාව (සැප්. 26. 2022) ඊට නිදසුනකි. මෙහි 13 හැවිරිදි බාලවයස් දැරියක ලිංගික අපයෝජනයට ලක් කිරීමේ සිදුවීමක් දැක්වෙන අතර, එය "දූෂණය" ලෙසින් ද පුවත් වාර්තාව තුළ සඳහන්ව තිබේ.

ඔබ සිතනා ආකාරයට,

1) බාලවයස් ලිංගික අපයෝජනයක ඇති බරපතළ භාවය "අඹු කමට ගැනීමක්" ලෙසින් පෙන්වන සිරස්තලයකින් ආවරණය වන්නේ ද? ඒ ඔස්සේ එවැනි වරදක් සාමාන්‍යකරණය වීමේ ඉඩක් නොමැතිද?

2) ලිංගික අපයෝජනයකට මුහුණ දුන් අයෙකු අපවිත්‍ර වී ඇති බවක් ගම්‍ය කරවන "දූෂණය" වැනි යෙදුමකට වඩා, ලිංගික අපරාධය/ලිංගික අපයෝජනය යන යෙදුම් වඩාත් උචිත නොවන්නේ ද?

ලිංගික අපයෝජනයක් සැහැල්ලු කොට වාර්තා නොකරමු!